# පඬියන්ගේ පුහු තර්ක හා පිළිතුරු

අප විසින් කලෙක සිට අසනු ලබන ප්‍රශ්නයක් වනුයේ දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම පමණක් සිදු වී ඇති අසාධාරණය කුමක් ද යන්න ය. මේ ප්‍රශ්නයට නිසි පිළතුරක් මෙතෙක් ලැබී නැත. එහෙත් විවිධ පුද්ගලයන් තම තම ඥාන මට්ටමින් විවිධ පිළිතුරු සැපයීමට උත්සාහ කර ඇති බව සැබෑ ය. ප්‍රශ්නයකට පිළිතුරු දීමට උත්සාහ ගැනීම යනු නිසි පිළිතුරක් දීම නො වෙයි. ඇතැමෙක් ප්‍රශ්නයට පිළිතුරක් ලෙස දීමට උත්සාහ කිරීමේ දී වතුවල වැඩකරන දෙමළ ජනයාගේ දුගීභාවය ගෙනහැර දැක්වූහ. තවත් සමහරු එක් ජනවාර්ගික කෝලාහලයක දී දෙමළ ජනයා අඩත්තේට්ටම්වලට ලක්වීම පෙන්වා දුන්හ. අළුත්ම උත්සාහය වී ඇත්තේ පසුගිය දා ලැගුම්හල්වලින් ඉවත්කෙරුණේ දෙමළ ජනයා පමණක් බව පෙන්වීම ය.

මෙවැනි පිළිතුරු සැපයීමට උත්සාහකරන්නන් අතර කවියෝ, ප්‍රබුද්ධයෝ, විශ්වවිද්‍යාලයීය ආචාර්යවරු මෙන් ම හිටපු මහාචාර්යවරු ද වෙති. එක් මහාචාර්යවරයකු තමා ගැන ම පවසන්නේ තමන් සාහිත්‍ය විචාරයෙහි එතෙක් තිබූ විචාර සමතික්‍රමණය කළ අයකු ලෙස ය. මොවුන්ගේ මේ සමතික්‍රමණ ගැන අප නොදන්නවා නො වේ. යමකුට යමක් සමතික්‍රමණය කළ හැක්කේ අළුත් දෙයක් නිර්මාණයකිරීමෙන් ය. එහෙත් මෙරට පඬියන් විසින් කෙරෙන අළුත් නිර්මාණ කවරේ ද? එක් තැනැත්තෙක් බටහිර ඇති විචාර ක්‍රමයක් සිංහලෙන් කියයි. ඔහු වෙනත් බොහෝ අය මෙන් ම කරන්නේ බටහිර දැනුමක් මෙරට බෙදාහැරීම ය. එය වෙළෙඳ සමාගමක් බටහිර නිෂ්පාදනයක් මෙරට බෙදාහැරීමෙන් වෙනස් නො වෙයි. ඇංකර් පිටි බෙදාහැරීම උදාහරණයක් ලෙස ගනිමින් මේ පඬියන් ඇංකර් පඬියන් හෝ ඇංකරයන් ලෙස හැඳින්වීම සාධාරණ වෙයි. ඇංකරයන් ඇත්තේ සාහිත්‍ය විචාරයෙහි පමණක් නො වේ. පරිගණක ක්ෂෙත්‍රයෙහි ද ඔවුහු වූවෝ ය. දැනුදු වෙති. ඔවුහු පරිගණක ගමට විකිණීමෙන් ලාභ ලැබූහ.

මෙවැනි ඇංකරයකු විසින් බෙදාහරිනු ලැබූ (හඳුන්වාදෙනු ලැබූ) බටහිර එක් විචාර ක්‍රමයක් වෙනුවට බටහිර වෙනත් ක්‍රමයක් ඊනියා සිංහල පාඨකයාට හඳුන්වාදෙන තැනැත්තා සමතික්‍රමණයක් කරන්නේ කෙසේ ද? සමතික්‍රමණ බටහිර රටවල කෙරෙයි. මෙරට පඬියන් අතින් කෙරෙන්නේ සමතික්‍රමණ හඳුන්වාදීම (වැමෑරීම) මිස සමතික්‍රමණ නො වෙයි. එහෙත් පඬියෝ කිසිම ලජ්ජාවක් නැතිව තමන් අහවලාගේ අහවල් එක සමතික්‍රමණය කළ බව ඊනියා සිංහල පාඨකයාට හඬනගා කියති. ජීවිතයේ කිසිම දිනක සංකල්පයක්, ප්‍රවාදයක් ගොඩනගා නොමැති මේ පඬියන් දෙන ඊනියා පිළිතුරු යන්නෙ කොහෙද මල්ලෙ පොල් ගණයට අයත් වෙයි.

අපේ ප්‍රශ්නය දෙමළ ජනයාට දෙමළ වීම නිසාම පමණක් සිදු වී ඇති අසාධාරණය කුමක් ද යන්න ය. එයට පිළිතුරු දීමේ දී වතුවල වැඩකරන දෙමළ ජනයාගේ දුක්ඛිත ජීවිත ගැන කතාකළ හැක්කේ සිංහලයන් කිසිවකුටවත් එවැනි ජීවිත නැත්නම් පමණකි. වතුවල වැඩකරන සිංහලයන් ද සිටිනවා පමණක් නොව වතුකම්කරුවන් නොවී වුව ද දුක්ඛිත ජීවිත ගතකරන සිංහලයෝ ද වෙති. වතුවල වැඩකරණ දෙමළ ජනයා දුක්විඳින්නේ ඔවුන් දෙමළ වීම නිසා නොව ඔවුන් වතුකම්කරුවන් වීම නිසා ය. වතුවල වැඩකරණ දෙමළ ජනයා පමණක් දුක්ඛිත ජීවිත ගතකර එහි වැඩකරණ සිංහලයන් සැපවත් ජීවිත තහකෙළේ නම් පඬියන්ගේ පිළිතුර ගැන කල්පනාකිරීමටවත් දෙයක් වෙයි.

වතුවල වැඩකිරීම නිසා දුක්විඳීම, දෙමළ වීම නිසා දුක්විඳීමක් ලෙස අර්ථකථනය කරන්නේ කිනම් න්‍යායකට (ලොජික්) හෝ තර්කණයකට හෝ අනුව දැයි පඬියන්ට තේරුම්කර දිය හැකි ද? වතුවල වැඩකරන්නන්ගෙන් බහුතරය දෙමළ වීම නිසා වතුවල වැඩකරන්නා අනිවාර්යයෙන් ම දෙමළ වන්නේ නැත. අනෙක් අතට දෙමළ ජනයාගෙන් ඇතමකු දුක්විඳීම නිසා දුක්විඳින සියල්ලන් දෙමළ වන්නේ ද නැත.

පඬියෝ ගැඹුරින් ප්‍රශ්න සාකච්ඡාකිරීම්, ඊනියා අපෝහක විධික්‍රම ආදිය ගැන පුරාජේරු කතා කියති. එහෙත් ඔවුන් දන්නා අපෝහකයක් නැති බව පැහැදිලි ය. ඔවුන් අඩුම තරමින් හෙගල් විද්වතාගේ ලොජික් නම් කෘතිය කියවා ඇත් ද යන්න සැක සහිත ය. එමෙන් ම ඔවුන්ගේ ඊනියා ගැඹුර කුමක් දැයි ඉහත සඳහන් උදාහරණයෙන් ම පැහැදිලි වෙයි. කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ පළමු හා දෙවැනි වසර සිසුන් සඳහා පැවැත්වෙන න්‍යාය හා තර්කණය පාඨමාලාවට සහභාගිවීමට පඬියන්ට හැකිනම් ඔවුන්ට යමක් ඉගෙනගැනීමට හැකිවනු නො අනුමාන ය.

© Prof. Nalin De Silva

දසුතුනේ ජූලියේ දී දෙමළ ජනයාට වූ අතවර දුටු එක් ඇදුරකු දෙමළ ජනයාට දෙමළවීම නිසා ම ඇති ප්‍රශ්නයට පිළිතුරක් ලෙස ඒ කරුණ ගෙනහැර දක්වා තිබුණි. එවැනි සිද්ධි ජීවිතය පුරා හෝ ඉන් සැලකිය යුතු කොටසක හෝ අත්විඳින සිද්ධි නො වෙයි. ඒ සිද්ධි දින ගණනකට පමණක් සීමාවෙයි. දෙවනුව දෙමළ ජනයාට එවැනි අතවරවලට දින කිහිපයකට පමණක් සීමා වී හෝ මුහුණ පෑමට සිදුවන්නේ ඔවුන් දෙමළ වීම නිසා ම පමණක් නො වේ. මෙහි දී වැදගත් වචනය වනුයේ පමණක් යන්න ය. කොළඹ දී හා වෙනත් ඇතැම් ප්‍රදේශවල එවැනි සිද්ධි නිසා දෙමළ ජනයාට ප්‍රශ්න ඇතිවන බව පැහැදිලි ය. එහෙත් ඒ ප්‍රශ්නය ඇතිවන්නේ දෙමළ ජාතිවාදී කැරලි, අරගල පසුබිම් කරගෙන ය. සාමාන්‍ය දිනක දී දෙමළ ජනයාට දෙමළ වීම නිසා පමණක් ඇතිවන ප්‍රශ්නයක් මෙහි නැත. ප්‍රශ්නය ඇතිවන්නේ දෙමළ ජාතිවාදය මුල්කරගෙන ය. තුන්වනුව දෙමළ ජාතිවාදය නිසා යාපනය මඩකලපුව ආදී පෙදෙස්වල සිංහලයෝ අතවරවලට ලක්වූහ. එබැවින් අතවරවලට ලක් වී ඇත්තේ දෙමළ ජනයා පමණක් නො වේ. අනෙක් අතට සිංහලයන් එසේ අතවරවලට ලක්වූයේ ඔවුන් සිංහල වීම නිසාම පමණක් ද නො වේ. දෙමළ ජාතිවාදය මුල්කරගෙන සිංහලයෝ එසේ එවැනි ප්‍රදේශවල හිරිහැරවලට ලක්වූහ. අද නම් සිංහලයන්ට යාපනයේ දී එවැනි අතවර විඳීමට සිදුවන්නේ නැත. සිංහලයන් පමණක් නොව මුස්ලිමුන් ද යාපනයෙන් පළවා හරිනු ලැබ ඇත !

ලැගුම්හල්වලින් දෙමළ ජනයා පමණක් ඉවත්කිරීම දෙමළ ජනයාට දෙමළවීම නිසා ම ඇතිවූ අසාධාරණයක් ලෙස විග්‍රහ කළ හැක්කේ ගැඹුරක් නැති පුස්සකුට ය. ලැගුම්හල්වලින් ඉවත්කෙරුණෝ දෙමළ ජනයා නොව ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ගනු ලැබූ යම් පියවරකට හසුවූවෝ ය. කොටි ත්‍රස්තවාදීන් ලැගුම්හල්වල ද නැවතී කොළඹ හා තදාසන්න ප්‍රදේශවල බෝම්බ අටවන බව ආරක්ෂක නිලධාරීන් විශ්වාසකරන බව පෙනෙයි. එයට පිළියමක් ලෙස පදිංචිය ගැන පිළිගතහැකි හේතුවක් දැක්වීමට නොහැකි වූ ලැගුම්කරුවන් තුන්සීයයක් පමණ ලැගුම්හල්වලින් ඉවත්කර ඔවුන්ගේ ගම් පෙදෙස්වලට ගෙන ගොස් ඇත. මෙහි දී ඉවත් කෙරෙන්නේ කොටි ත්‍රස්තවාදයට සම්බන්ධ යැයි සැකකෙරෙන්නන් මිස දෙමළ ජනයා නො වෙයි. කොටි ත්‍රස්තවාදීන්ගෙන් අති විශාල බහුතරය දෙමළ වීම නිසා මෙලෙස සැකයට පාත්‍රවන්නෝ බොහෝ විට දෙමළ වෙති. ඒ වෙනත් කරුණකි. කොටි ත්‍රස්තවාදීන්ගෙන් ඉතා සීමිත පිරිසක් සිංහල වෙති. ඔවුන් කොළඹ ලැගුම්හල්වල නොමැතිවීම නිසා මේ ප්‍රශ්නය දෙමළ ජනයාට දෙමළවීම නිසාම පමණක් සිදු වූ ප්‍රශ්නයක් ලෙස අර්ථකථනය කළ නො හැකි ය. මෙහි දී කිවයුතු තවත් කරුණක් වෙයි. ලැගුම්හල්වල සිටියවුන් ආපසු යැවුණේ ඔවුන්ගේ ගම් පෙදෙස්වලට මිස ඊනියා නිජ භූමියකට නො වෙයි. නිජ භූමිය යනු භුදෙක් පුද්ගලයකුගේ උපන් ප්‍රදේශය හෝ ජීවත්වන ප්‍රදේශය හෝ නො වෙයි. එයට දේශපාලන අර්ථයක් ඇත. දේශපාලන වශයෙන් ගත්කල නිජභූමි ඇත්තේ ජාතියකට, ජනවර්ගයකට මිස පුද්ගලයකුට නො වේ. පුද්ගලයකුට ඇත්තේ උපන් ප්‍රදේශයකි. නැත්නම් ජීවත්වන, පදිංචි ප්‍රදේශයකි. පුද්ගලයන්ට උපන්ගම් මිස දේශපාලන අර්ථයකින් නිජභූමි නැත.

මේ පඬියන්ට හා ඊනියා මානව හිතවාදීන්ට (මානව හිතවාදී වීම ද අද හොඳ ආදායමක් ලැබිය හැකි රැකියාවකි.) නො පෙනෙන තවත් කරුණක් වෙයි.  අසූහතේ සිට අනූදෙක පමණ වන තෙක් ජ වි පෙරමුණේ අරගල තිබි සමයේ දී ආරක්ෂක අංශ විසින් අත් අඩංගුවට ගනු ලැබුවෝ සිංහලයෝ වූහ. බොහෝ විට සිංහල තරුණ තරුණියෝ වූහ. එහෙත් එපමණකින් ඒ සිංහලයන්ට සිංහල වීම නිසා ම පමණක් ඇති වූ ප්‍රශ්නයක් බවට පත් නො වෙයි. ආරක්ෂක අංශවලට අවශ්‍ය වූයේ ජ වි පෙ සාමාජිකයන් හා අනුගාමිකයන් ය. ඒ අයගෙන් බහුතරය සිංහලයෝ වූහ. එබැවින් එකල සිංහල තරුණ තරුණියන් අඩත්තේට්ටම්වලට ලක්වූයේ ඔවුන් සිංහල වීම නිසා ම පමණක් යැයි අපි නො කියමු. ඔවුන් එසේ අඩත්තේට්ටම්වලට ලක්වූයේ ඔවුන් ප්‍රධාන වශයෙන් ම ජ වි පෙ සාමාජිකයන් හෝ අනුගාමිකයන් හෝ ලෙස සැකයට පාත්‍ර වූ බැවින් ය.

පඬියන් මේ කරුණු අමතක කරනවා පමණක් නො වේ. ඔවුහු එකල ජ වි පෙ සාමාජිකයන්ගේ, අනුගාමිකයන්ගේ හෝ එලෙස සැකකරන්නවුන්ගේ මානව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී නො සිටිය හ. එපමණක් නො වේ. එදා කොළඹ විශ්වවිද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරීහු හා ඇතැම් මාක්ස්වාදී පක්ෂවල සාමාජිකයෝ  ජ වි පෙරමුණෙහි යැයි සැක කළවුන්ට එරෙහිව ආයුධ අතට ගත්හ. අද මේ මාක්ස්වාදීහු බටහිර ධනේශ්වර රටවල තානාපතිවරුන් සමග එකට සිටිමින් දෙමළ ජාතිවාදය වෙනුවෙන් පෙනී සිටිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva